# නාට්‍ය හා රංගකලාව

07 ශ්‍රේණිය - දෙවන වාරය

## සිව්වන පාඩම
## ඇසූ සැණින් රඟමු

### තේමාවක් ඔස්සේ පරිකල්පනය මෙහෙයවමු, (සාමූහික හා කේවල)

- ක්ෂණික නිරූපණයක් යනු පෙර සූදානමකින් තොරව පිටපතක් භාවිතයෙන් හෝ පුහුණුවකින් තොරව චරිතයක්, සිද්ධියක්, හෝ අවස්ථාවක් රඟදැක්වීම ය. ක්ෂණික නිරූපණයේ දී

  - තෝරාගන්නා මාතෘකාවට අදාළ ව නිර්මාණය ගොඩනැගිය යුතු වේ.
  - පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මාණාත්මක ව ඉදිරිපත් කළ යුතු ය.
  - තමන් ගේ අත්දැකීම් මෙන් ම කණ්ඩායමේ අන් අයගේද අත්දැකීම් ද නිර්මාණය සඳහා යොදාගත හැකි ය.
  - කණ්ඩායම තුළ ක්ෂණික ව තීරණ ගැනීම සිදුවිය යුතු බව.
  - තෝරාගත් නිරූපණයට අවශ්‍ය නළුවරණය ක්ෂණික ව කළ යුතු ය.
  - තේමාව අනුව, සතුන් මිනිසුන් ද්‍රව්‍ය උපයෝගී කරගෙන ක්ෂණික නිරූපණය කළ යුතු ය.

### ❖ ක්ෂණික නිරූපණවලින් අත්වන ප්‍රයෝජන,

- මෙම නිරූපණ මගින් නිර්මාණශීලී චින්තනය පරිකල්පන ශක්තිය වැනි ගුණාංග වර්ධනය වේ.
- අවස්ථාවට උචිත පරිදි කටයුතු කිරීමේ හැකියාව වර්ධනය වේ.
- සබකෝලයෙන් තොර ව අවධානයෙන් යුක්ත ව කණ්ඩායම් හැඟීමෙන් තම දායකත්වය නිරූපණය සඳහා ලබාදීමට සිදුවේ.
- සාමූහිකත්වය වර්ධනය වීම.
- රංගන කුශලතාව වර්ධනය වීම.

### ❖ පහත දැක්වෙන්නේ සමූහ නිරූපණයන් සඳහා මාතෘකා කිහිපයකි.

- මළ ගෙයක්
- මගුල්ගෙයක්
- බස් රථයක්තුළ
- සතුන් වත්තක්
- පිස්සන් කොටුවක්

**පැවරුම** : ඉහත මාතෘකා උපයෝගී කර ගෙන ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කරන්න.

### අභ්‍යාස

1* ක්ෂණික නිරූපණයේ දී අනුගමනය කළ යුතු කරුණු 3ක් ලියන්න.
2* ක්ෂණික නිරූපණවලින් රංගන ශිල්පියාට අත්වන ප්‍රයෝජන 4ක් ලියන්න.